**නැගෙනහිර විශ්වවිද්‍යාලය - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුයි.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදයට අනුව, වත්කම් භාවිතයට ගැනීමට සුදුසු තත්ත්වයට පත් කලවිට ක්ෂය වීම ආරම්භ ආරම්භ කළ යුතුය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව, වත්කම් අත්පත් කරගත් වර්ෂය තුළ ක්ෂය කිරීම සිදු කරනු නොලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා ක්ෂයවීම් රු.3,232,596කින් අඩුවෙන් දක්වා තිබුණි. | ක්ෂයවීම් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය SLPSAS සමග අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය හා විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන බව.- | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 50 වැනි ඡේදයට අනුව ආයතනයක මෙහෙයුම් වල එකම ස්වභාවයේ හෝ එකම භාවිතයෙන් යුතු වත්කම් වර්ග කර දැක්වීමකින් තොරව පිරිවැය රු.110,173,417 ක්වූ අනෙකුත් වත්කම් සහ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන ව්‍යාපෘතිය කඩිනම් කිරීමේ ව්‍යාපෘතියෙන්(AHEAD) ලැබී තිබූ පිරිවැය රු.348,908,722 ක්වූ වත්කම් දේපල,පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | එය පැහැදිලි කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනයේ "AHEAD" කාණ්ඩය යටතේ ඉදිරිපත් කර ඇති බව | AHEAD ව්‍යාපෘතියෙන් අදාළ වත් AHEAD ව්‍යාපෘතියෙන් අදාළ වත්කම් AHEAD ව්‍යාපෘතියෙන් ලද වත්කම් කාණ්ඩගත කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළ දී ලැබී තිබුණු රු.313,109,540 ක්වූ ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව ආදායම ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාලන අධිකාරියේ අනුමැතිය ඇතිව SLPSAS 11 අනුගමනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2022 සහ 2023 වර්ෂවල දී ස්ථාවර වත්කම් ලේඛනය සඳහා වූ මෘදුකාංගය වෙනස් කිරීම සඳහා දරන ලද රු.1,032,395ක වියදම ප්‍රාග්ධනිත කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන තුළ වියදමක් ලෙස කපා හැර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඌනතාවය සහ අස්පෘශ්‍ය වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පරිගණක මෘදුකාංග කාණ්ඩය යටතේ ස්ථාවර වත්කම් ලේඛන පද්ධතිය වෙනස් කිරීම සඳහා දරන වියදම ප්‍රාග්ධනිත කිරීමට දැනටමත් කටයුතු කර ඇති බව. | අදාළ වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෙක්ටයාර 241.2ක විශාලත්වයකින් යුතු විශ්වවිද්‍යාලයට අයත් ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | හිමිකාරිත්වය පැවරීම අවසන් වූ වහාම, SLPSAS 07 වන ගිණුම්කරණ ප්‍රමිතියට දැඩි ලෙස අනුකූලව කඩිනම් සහ කඩිසර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලබන බව. | ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට මුළු ලැබිය යුතු රු. 431,315,889 ක ශේෂයෙන් රු.238,964,922 ක් හෙවත් සියයට 52 කට සමාන මුදලක් වසර 03 සිට වසර 40 දක්වා කාලයක් තුළ අයකරගෙන නොතිබුණි. ඉන් බැඳුම්කර ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් 66 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 147,164,353 ක් වූ බැඳුම්කර වටිනාකම වසර 10 සිට වසර 41 දක්වා කාලයක් ගත වී තිබුණද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අනෙකුත් බැඳුම්කර පැහැර හැරීම්කරුවන්ට සහ ඔවුන්ගේ ඇපකරුවන් වෙත ඉල්ලීම් ලිපිය යවා ඇත. තවද බැඳුම්කර පැහැර හැරියවුන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා තානාපති කාර්යාලයන්හි මහ කොමසාරිස් වෙත අදාළ ලිපි යැවීමට පාලක තීරණය කළ බව. | බැඳුම්කර කඩකරන්නන්ගෙන් බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | 2023 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය විසින් ගෙවිය යුතු එකතුව රු.3,973,526ක් වසර 03 සිට වසර 18 දක්වා කාලයක් තුළ නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගෙවිය යුතු සියලුම හිඟ මුදල් නියමිත වේලාවට පියවීමට මේ වන විට උත්සාහ ගනිමින් සිටින බව. | ගෙවිය යුතු මුලු මුදලම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ මූල්‍ය රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 සහ 2015 සැප්තැම්බර් 9 දිනැති අංක 05/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මුදල් චක්‍රලේඛ ලිපිය. | .ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ (SLUG) ඉසව්වලට අදාළව රුපියල් 4,845,200ක් එකතු වී අත්තිකාරම් ගෙවීම දින 32 සිට 112 දක්වා ප්‍රමාද වූ අවස්ථා 22ක් ඇත.<br>2023 ජුනි 24 වැනි දින විශ්වවිද්‍යාල කවුන්සිලය විසින් තීරණයක් ගන්නා ලදී, රුපියල් 100,000 ක චක්‍රලේඛ සීමාවට පටහැනිව SLUG ඉසව්ව සඳහා උපරිම වශයෙන් රුපියල් 500,000 දක්වා අත්තිකාරම් ගෙවිය හැකිය. ඒ අනුව මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සීමාව ඉක්මවූ අවස්ථා 24කදී රුපියල් 7,254,680ක අත්තිකාරම් ලබා දී ඇත. | බොහෝ අත්තිකාරම් නියමිත කාල සීමාව තුළ පියවා ඇත. | මූල්‍ය රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුයි. |
| (ii) | මුදල් රෙගුලාසි 383 | බැංකු ගිණුම් තුනකට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි හඳුනා නොගත් ඍජු හර හා උපලබ්ධි නොවූ තැන්පතු ලෙස පිළිවෙළින් රු. 3,925,059ක් සහ රු. 1,604,146 ක් හඳුනා ගැනීමකින් වසර 13 කට වැඩි කාලයක සිට දක්වා තිබුණි. | 2009 ට පෙර ලියකියවිලි සොයා ගැනීමට පාලක මණ්ඩලයට නොහැකි වූ අතර පාලක මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි අවශ්‍ය කපා හැරීම් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව. | කපා හැරීමට පෙර අදාළ තැන්පතු හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් | එකතු වටිනාකම රු. 16,264,477 ක් වූ රැඳවුම් මුදල් තැන්පතු 51 ක් සහ | ඉහත ක්‍රියා පටිපාටියට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග | මුදල් රෙගුලාසිවලට |

| | | | | |
|---|---|---|---|---|
| | රෙගුලාසි 571 | වර්ග 08කට අදාළව එකතු වටිනාකම රු. 6,916,081 ක් වූ ආපසු ගෙවිය හැකි තැන්පතු පියවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කිරීමකින් තොරව ගිණුම්වල වර්ෂ 03 සිට වර්ෂ 08 දක්වා කාලසීමාවක් තුළ ගිණුම්වල ඉතිරිවී තිබුණි. | ගනු ලබන බව. | අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | | | |
| (i) | III පරිච්ඡේදයේ 20.8 උප වගන්තිය සහ VI පරිච්ඡේදයේ 4.1 උප වගන්තිය | 2020 අගෝස්තු 29 දින උද්භිදවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගේ ඉල්ලා අස්වීම පාලක සභාව විසින් පිළිගෙන තිබුණි. පසුව කථිකාචාර්යවරයා 2020 සැප්තැම්බර් 02 සිට බලපාන පරිදි කලින් දරන ලද තනතුරෙහි නැවත සේවයේ පිහිටුවා තිබුණි. කෙසේ වෙතත්, අදාළ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදනවලට පටහැනිව රු.91,310ක්වූ මූලික වැටුප් පියවරයෙහි පිහිටුවීම වෙනුවට රු.119,520 වැටුප් පියවරෙහි පිහිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නැවත සේවයේ නියුක්ත වූ දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් එම නිලධාරියට රු.3,633,900 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පාලක සභාව විසින් 340 වැනි රැස්වීමේ තීරණය අනුව ඇයගේ වැටුප් ලක්ෂ්‍යය නැවත සකස් කිරීමට දැනටමත් කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ii) | 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපිය මගින් සංශෝධිත XXVI පරිච්ඡේදයේ 3. වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය පවත්වා එහි වාර්තාව 2024 ජූලි 17 වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2020, 2021 සහ 2022 වසර සඳහා සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අවසන් කර නොතිබුණි. | භාවිතයට නුසුදුසු සියලුම භාණ්ඩ බැහැර කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව වාර්තා ඒ අනුව සකස් කරනු ලබන බව. | ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.- |

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| (i) 2018 ඔක්තෝම්බර් 12 දිනැති ලිපිය | මහපොළ භාරකාර අරමුදල් මාසිකව ප්‍රතිපූරණය කළ යුතු වුව ද රු.2,305,000 ක් වසර තුනකට වැඩි කාලයක සිට ප්‍රතිපූරණය නොකර අයවිය යුතු ලෙස දක්වා තිබුණි. | ශිෂ්‍යාධාර අරමුදල් ප්‍රතිපූරණය කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ නිරන්තර සන්නිවේදනය සහ පසු විපරම් පවත්වාගෙන ගිය බව. | විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) 2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4 වැනි ඡේදය. | 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.131,242,338 ක් වූ පුස්තකාල පොත් සහ වාර සඟරාවල පිරිවැය සත්‍යාපනය කර නොතිබුණි. | 2024 ජනවාරි මස ආරම්භ කරන ලද පොත් සහ වාර සඟරා ප්‍රසම්පාදනය සඳහා සාමාන්‍ය සම්මත ක්‍රියා පටිපාටි දැනට ක්‍රියාත්මක වෙමින් පවතින බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 379,540,072ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 503,716,980ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.124,176,908ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් රාජධානියේ ආචාර්ය උපාධියක් සඳහා රු.14,258,446 ක බැඳුම්කරයක් අත්සන් කළ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ කථිකාචාර්යවරයකුට අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යයන නිවාඩුවේ ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් විශ්වවිද්‍යාලයට පාඨමාලා ගාස්තු සහ දීමනා වෙනුවෙන් රු.3,601,837 ක අමතර මුදලක් වැය වී තිබුණද ඊට වගකිව යුතු නිලධාරියාට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිසි බලධාරි කාලසීමාව තුළදී, පරිවාස කාලය දීර්ඝ කිරීමට සභාව විසින් අනුමත කරන ලද අතර සහ ගෙවීම් විශේෂ අවස්ථාවක් ලෙස සලකා ඇති බවත් එය අනාගතයේදී නැවත සිදු නොවනු ඇති බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි ආයතන සංග්‍රහය දැඩි ලෙස පිළිපැදීමට කටයුතු කළ යුතුය. |

**3.2** ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 06 දිනැති අංක 21/2084/306/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ2021 දෙසැම්බර් 30 දිනැති අංක 4/1/1/501 VOL XIII දරන ග්‍රාමීය නිවාස ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ලේකම්වරයාගේ ලිපියට අනුව , කොන්ත්‍රාත්කරුවන්ට මිල වෙනස්වීම් සඳහා වන්දි ගෙවීමේදී CIDA හි මිල විචලන සූත්‍ර භාවිතා කරමින් කොන්ත්‍රාත් වටිනාකමින් 20% නොඉක්මවිය යුතුය. කෙසේ වෙතත්, බහුකාර්ය ශ්‍රවණාගාරයක් සඳහා සැලසුම් කිරීම, ඉදිකිරීම සහ කොමිස් කිරීම පදනම මත දෙමහල් ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු. 36,762,239 ක මිල වැඩිකිරීමක් ලෙස ඉල්ලා ඇති අතර, එය ඉටු කරන ලද වැඩවලින් රු.13,928,550ක් හෙවත් 32.2% සීමාව ඉක්මවා යාමක් විය. | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2022.09.23 දිනැති අංක. HE/IDD/GEN/2022/01 දරන ලිපියට අනුව, මිල වැඩිකිරීමේ වන්දි මුදල සඳහා (කොන්ත්‍රාත් මුදලින් 20%) සීමාවක් සඳහන් කර නොමැති බව. | අදාළ බලධාරීන්ගේ උපදෙස් දැඩි ලෙස පිළිපැදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විදුලිබල සැපයුමේ දෝෂ හේතුවෙන් ජාල සම්බන්ධ කිරීම සඳහා වූ රු. 28,756,766 ක් වූ කොන්ත්‍රාත්තුව 2022 අගෝස්තු මාසයේදී අවසන් කිරීමට නොහැකි වූ අතර සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨයේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු පෙර කී හේතුව මත අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | නොවැළැක්විය හැකි බොහෝ හේතු නිසා, සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨයේ ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති අවසන් කිරීමේ දිනය කිහිප වතාවක් දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, ජාල සම්බන්ධතාවය සැපයීම සහ ස්ථාපනය 2024.02.29 දින සාර්ථකව නිම කර ඇති බව. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව විදුලිය ලබාදී ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ත්‍රිකුණාමලය මණ්ඩපයේ කිලෝමීටර් 3 ක අභ්‍යන්තර මාර්ගය ඉදිකිරීම 2017 දී මාර්ග සංවර්ධන අධිකාරිය හරහා පුද්ගලික සමාගමකට රු. මිලියන 145ක කොන්ත්‍රාත් වටිනාකමට ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් කාලය තුළ ඉදිකිරීම් අවසන් කර නොතිබූ අතර, 2017 සිට 2023 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී දින දීර්ඝ කිරීම් හතරක් ලබා දී තිබුණි. මෙම දින දීර්ඝ කිරීම් ලබා දී තිබියදීත් රු. මිලියන 60 ක් වැය කර මාර්ගයේ කිලෝමීටර් 1.3 ක් පමණක් ඉදි කර තිබුණි. වසර හයක සැලකිය යුතු ප්‍රමාදයක් සිදු වී තිබූ අතර කිලෝමීටර් 1.7 ක්වූ මාර්ගයේ ඉතිරි කොටස 2023 දෙසැම්බර් 31 දක්වාම නිම කර නොතිබුණි. | රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන මිල විශාල ලෙස ඉහළ ගිය අතර මේවායේ ප්‍රතිඵලයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය ඇස්තමේන්තුව කිහිප වතාවක් සංශෝධනය කළ අතර මාර්ගයේ ඉතිරි කිලෝමීටර් 1.7 සම්පූර්ණ කිරීමට එම අරමුදල ප්‍රමාණවත් නොවුණු බව. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වන විට අධ්‍යයන, අනධ්‍යයන, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සහ පරිපාලන තනතුරුවල අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 49ක් වන සමස්ත තනතුරු 136ක් පුරප්පාඩු වී පැවතුණි.. මෙම තත්ත්වය සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට දැඩි ලෙස බලපෑවද මණ්ඩපය මේ සම්බන්ධයෙන් නිසි පියවරක් ගෙන නොතිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශයේ 2022 පෙබරවාරි 22 දිනැති ලිපියට අනුව ස්ථිර හා තාවකාලික තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය නතර කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |